අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
PRIME MINISTER'S OFFICE

**Presidential Task Force for Essential Services**

58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.

මගේ යොමුව / எனது குறிப்பு / My Ref.: PTF/01/Circular/01 | ඔබේ යොමුව / உமது குறிப்பு / Your Ref.: | දිනය / திகதி / Date: 2020.04.17

චක්‍රලේඛ අංකය : PTF/03/2020 (iii)

**සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්**

**සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත**

**<u>උද්ගත වී ඇති ව්‍යසනකාරී තත්ත්වය නිසා සමාජ ප්‍රතිලාභ වැඩසටහන යටතේ පොරොත්තු ලේඛන ගත කර ඇති ප්‍රතිලාභීන් සඳහා රු.5000/-ක දීමනාවක් ගෙවීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති අංක PTF/03/2020 (ii) හා 2020.04.15 දිනැති චක්‍රලේඛයේ (5) වන ඡේදයේ කරුණු පිළිබඳ වැඩිදුර පැහැදිලි කිරීමක් පහත දක්වා ඇත.

02. පවතින තත්ත්වය හේතුවෙන් ජීවනෝපාය අහිමි වීම යටතේ ප්‍රතිලාභ ලබා දීම සඳහා සුදුස්සන් තේරීමේ දී මීට පෙර නිකුත් කරන ලද චක්‍රලේඛ වලින් සමෘද්ධි දීමනා ලැබීමට සුදුසුකම් ලබන පවුල් ඒකක වේ නම්, එම පවුල් ඒකක මෙම ජීවනෝපාය අහිමි වීම මත ලබා දෙන රු. 5,000/= දීමනාව ලබා ගැනීමට සුදුසුකම් නොලබයි. එලෙසම, දැනටමත් රාජ්‍ය, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල රැකියාවක නියුතු හෝ විශ්‍රාම වැටුප් ලබන/ගොවි හෝ ධීවර විශ්‍රාම වැටුප් ලබන පුද්ගලයින් හෝ පෞද්ගලික අංශයේ ස්ථිර රැකියාවක නියුතු පුද්ගලයෙකු හෝ සිටින පවුල් ඒකක ද මෙම දීමනාව ලබා ගැනීමට සුදුසුකම් නොලබයි.

03. එහෙත්, වැඩිහිටි, සියවස් පූර්ණ වැඩිහිටි, ආබාධිත හා වකුගඩු යන දීමනාවලට සුදුසුකම් ලබන පුද්ගලයෙකු /පුද්ගලයින් සිටින පවුල් ඒකකයක් වුව ද, පවතින තත්ත්වය මත සැබෑ වශයෙන් ම ජීවනෝපාය අහිමි වී ඇති බවට ග්‍රාමීය කමිටුව නිර්දේශ කරන්නේ නම්, එම පවුල් ඒකකය ද, ජීවනෝපාය අහිමි වීම මත ලබා දෙන රු.5,000/= දීමනාව ලබා ගැනීමට සුදුසුකම් ලබයි.

**ගාමිණී එස්. සෙනරත්**
අග්‍රාමාත්‍ය ලේකම්
ප්‍රධාන මෙහෙයුම් නිලධාරි- අත්‍යවශ්‍ය මහජන සේවාවන් අඛණ්ඩව සැපයීම මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසුවිපරම පිණිස වූ ජනාධිපති කාර්යසාධන බලකාය

පිටපත්:

01. ජනාධිපති ලේකම්
02. අමාත්‍ය මණ්ඩල ලේකම්
03. විගණකාධිපති

} කාරුණික දැන ගැනීම සඳහා

04. ලේකම්, මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
05. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
06. ලේකම්, කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය

} අවශ්‍ය කටයුතු සඳහා

කාර්යාලය / அலுவலகம் / Gen. Office: 2575317, 2575318 | ෆැක්ස් / பெக்ஸ் / Fax: 2574143, 2575454, 2575310 | විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail: secpm@pmoffice.gov.lk